# හඬ

CED ත්‍රෛමාසික පුවත් සඟරාව

CED Sri Lanka

Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව කලාපය 2025 ජුනි





# හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම

හදිසි අවස්ථාවන් තුළදී අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ජාතික වශයෙන් පමණක් නොව, ජාත්‍යන්තර වශයෙන් ද අවධානය යොමු ව තිබෙන බව වර්තමානයේදී හඳුනාගත හැකිය. අධ්‍යාපනය සියලු දෙනාගේ අයිතිවාසිකමක් වන අතර එය ලඟා කර ගැනීමේදී ස්ත්‍රී, පුරුෂ බේදයකින් තොරව යම් යම් අවස්ථාවන්හිදී සියලුම දෙනා විවිධ බාධාකාරී තත්ත්වයන්ට මුහුණ දෙන බව හඳුනාගත හැකිය. 'හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම' යන්නෙන් සරලව හැඳින්වෙන්නේ ගුණාත්මක අධ්‍යාපන අවස්ථා, අර්බුධකාරී අවස්තාවන් තුලදී වුවත් සියලුම දෙනාට ලබාදීමයි. මෙහිදී පෙර පාසල් අධ්‍යාපනය, ප්‍රාථමික, ද්විතියික, තාක්ෂණික, වෘත්තීය, උසස් හා වැඩිහිටි අධ්‍යාපනය යන සියලුම කාණ්ඩයන් අන්තර්ගත වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම ඉතා වැදගත් විෂය කොටසක් වන අතර භෞතික, මානසික හා තිරසාර පැවැත්ම උදෙසා ජීවිත රැකගැනීමට උපකාරී වේ. හදිසි අවස්ථා අධ්‍යාපන ප්‍රතිචාරය ඉතාමත් වැදගත් වන අතර මෙය පුළුල් සංකල්පයකි. හදිසි අවස්ථාවන් තුළ දී අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් INEE ප්‍රමිතීන්හි දැක්වෙන්නේ පහත පරිදිය.

*'Education in emergencies' refers to the quality learning opportunities for all ages in situations of crisis, including early childhood development, primary, secondary, non-formal, technical, vocational, higher and adult*

3 වන පිටුවට

## ඇතුළත


| | |
|---|---|
| ශ්‍රී ලංකාව පිළිබඳ මූලික දත්ත හා රජයේ පාසල් පිළිබඳ මූලික තොරතුරු | 2 |
| කාන්තා ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් | 7-9 |
| ස්වභාවික ආපදා අවස්ථාවලදී සබරගමුව පළාතේ පාසල් අධ්‍යාපනයේ අඛණ්ඩභාවය සහ එයට බලපාන සාධක | 7-9 |
| Eco - School | 9 |
| අධ්‍යාපන සංවර්ධන සන්ධානය, 2025 වසරේ අධ්‍යාපනයේ උන්නතිය උදෙසා ගනුලැබූ නව ප්‍රයත්නයන් | 10-12 |

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**අපගේ අරමුණු**

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරිම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

## ශ්‍රී ලංකාව පිළිබද මූලික දත්ත හා රජයේ පාසල් පිළිබද මූලික තොරතුරු

| Country Fact and Figures | |
|---|---|
| Mid-year population ('000) (2023) | 22,037 |
| Population density (2023) persons per sq.km. | 351 |
| Gini coefficient of household income (2019) | 0.46 |
| HDI (Value/Rank): Rank among 193 countries | 0.780 – 78 |
| Primary net enrolment ratio | 85.1% |
| Age specific enrolment ratio (grade 1-9) | 90.6% |
| Age specific enrolment ratio (age 18-22 yrs): Only includes internal enrolment of university students | 9.9% |
| From A/L eligible for university admission | 63.3% |

Sources: Annual Census Bank Report 2023

| Basic Statistic of the Government School - 2023 | |
|---|---|
| All Government Schools | 10,096 |
| National Schools | 396 |
| Provincial Schools | 9700 |
| All Teachers | 237,787 |
| Male Teachers | 56,570 |
| Female Teachers | 181,217 |
| Education Zones | 100 |
| Education Divisions | 312 |

Sources: Annual School Census Report 2023 – Ministry of Education

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.


අධ්‍යාපන සංවර්ධන සන්ධානය

නො. 17, ධර්මපාල මාවත,

රාජගිරිය.



**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**

කේ. ඩී. පීරිස් මහතා, වජිර උමගලිය මහතා, මහින්ද සිල්වා මහතා, එම්. ඒ. ජේ. රියාස් මහතා, එස්. පී. මෝහන් මහතා

1 වන පිටුවෙන්

*education. Education in emergencies provides physical, psychosocial, and cognitive protection that can sustain and save lives. Common situations of crisis in which education in emergencies is essential include conflicts, situations of violence, forced displacement, disasters, and public health emergencies. Education in emergencies is a wider concept than 'emergency education response' which is an essential part of it. (INEE, 2018)*

යුද ගැටුම්, ප්‍රචණ්ඩකාරී තත්ත්වයන්, වසංගත රෝග, ස්වභාවික විපත්, වාසස්ථාන නොමැතිකම යනාදී හදිසි තත්ත්වයන් හමුවේ අධ්‍යාපන හදිසි තත්ත්වයන් ඇති වන අතර එමගින් සියල්ලෝ පීඩාවට ලක්වෙති. එබැවින් හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් වන්නේ ඒ සඳහා දක්වන යෝග්‍යය හා තිරසාර විසඳුම් ය.

මෙම පීඩාකාරී තත්ත්වයන්ගේ ප්‍රතිඵලයන් කෙටි කාලීන හා දිගු කාලීන ඍණාත්මක ප්‍රතිපලයන් ගෙන ඒමට හේතුවන බව අප සැවොම දන්නා කරුණකි.

UNESCO සංවිධානය දක්වන ගෝලීය දත්තවලට අනුව,

- ලොව පාසල් යන වයසේ දරුවන්ගෙන් මිලියන 324 දෙනෙකු අර්බුද නිසා බලපෑමට පත්ව ඇත.
- පාසල් යන ළමුන්ගෙන් බිලියන 01ක් දේශගුණ විපර්යාසවලින් අවධානමට ලක්විය හැකි ප්‍රදේශවල ජීවත් වේ.
- අධ්‍යාපනයට බාධාකාරී අවස්තාවන් 6000 ක් වාර්තා වී ඇත.
- ලොවපුරා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය මඟ හැරුණු ළමුන්ගෙන් 49% ක් ළමුන් හා තරුණයන් වේ.

ඊට අමතරව, ස්වාභාවික විපත් හරහා අධ්‍යාපනයට සිදුව ඇති බලපෑම කෙරෙහි අවධානය යොමු කිරීමේදී 2024 වසරේදී මොසැම්බික්හි පැවති ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ඇති වූ සුළි සුළං තත්ත්වයන් නිසා ආසන්න වශයෙන් ළමුන් 150,000 කට ආසන්න සංඛ්‍යාවක් පිඩාවට පීත්විය. සුඩාන් හි වර්තමානයේ පවතින යුධ තත්ත්වය හේතුවෙන් මිලියන 19 කට අධික ළමුන් සංඛ්‍යාවකගේ පාසල් යාම නැවතී තිබේ. මේ ආකාරයට ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල්හි පවතින මෙම අර්බුදකාරී අවස්තාවන් නිසා පීඩාවිඳින ළමයින් සංඛ්‍යාව අති විශාල බව පසක් වනු ඇත.

එබැවින් හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම, අනාගත ළමා පරපුරේ අභිවෘද්ධිය උදෙසාත් අඛණ්ඩ, ගුණාත්මක හා සමාන අධ්‍යාපනයක් පවත්වා ගැනීම උදෙසාත්, ගෝලීය යහ පැවැත්ම උදෙසාත් හේතු වන බව හඳුනාගත් බැවින් එවැනි හදිසි තත්ත්වයකදී අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි ගෝලීය අවධානය යොමු විය. එබැවින් හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා තිරසාර උපායමාර්ග අවශ්‍ය වේ. අර්බුධකාරී අවස්තාවන් තුලදී ඒවා කළමනාකරණය කිරීමේ වැදගත්කම, එවැනි තත්ත්වයකදී ළමුන් ආරක්ෂා කර ගැනීම හා ප්‍රජාවගේ දායකත්වයෙන් යුතුව යළි අධ්‍යාපනය නගා සිටුවීම ඉතා වැදගත් වේ. එසේම මෙහිදී මනෝ උපදේශනය ලබාදීම, අඛණ්ඩව අධ්‍යාපනය පවත්වාගෙන යාම, අතරමගදී පාසල් අධ්‍යාපනය මඟ හැරෙන ළමුන්ගේ සංඛ්‍යාව අඩු කිරීම, ප්‍රජා සවිබල ගැන්වීම හා තනිපුද්ගල හා කුටුම්බ ලෙස සමාජයීය වශයෙන් සුරක්ෂිත වටපිටාවක් ඇතිකිරීම වැදගත් වේ.

හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය කෙරෙහි, ශ්‍රී ලංකාව අවධානය යොමුකර තිබේ. ශ්‍රී ලංකාවේ ස්වභාවික පිහිටීම මත විවිධ ස්වභාවික විපත් වලට ප්‍රජාව මුහුණදීම නිරන්තරයෙන් හඳුනාගත හැකි අතර ඒවායින් සිදුවන ආර්ථික, සමාජ හා දේශපාලන බලපෑම අතිවිශාලය. ආපදා තත්ත්වයන් නිසා පාසල් අධ්‍යාපනයට සිදුවන බලපෑම අතිවිශාල වන අතර එය පාසල් අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා බලපෑම් සිදු කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වාදෙන ආකාරයට සෘජු හෝ වක්‍රව සිදුවන මානව ක්‍රියාකාරකම් මගින් වායුගෝලීය සංයුතියේ ඇති වන වෙනස්කම් නිසා දේශගුණ විපර්යාස ඇතිවේ. ශ්‍රී ලංකාව මුහුණ දෙන ස්වභාවික ව්‍යසන තත්ත්වයන් අතර ගංවතුර, නායයාම්, නියං,




ශ්‍රී ලංකාවට බලපාන උපද්‍රව වන්නේ ගංවතුර, සුළිසුළං, නායයාම්, නියගය, කාර්මික අනතුරු, සුනාමි, භූමිකම්පා, ගුවන්යානා අනතුරු, සමුද්‍රීය උපද්‍රව, හදිසි ගින්න, අකුණු සැර/ටොනාර්ඩෝ, වෙරළ ඛාදනය, වසංගත, පිපිරීම්, ගුවන් ප්‍රහාර, සිවිල් හෝ අභ්‍යන්තර ගැටුම්, රසායනික අනතුරු, විකිරණශීලීත්වයෙන් හටගන්නා අනතුරු, තෙල් පිටාර ගැලීම්, නාගරික හා වනාන්තර ගිනිගැනීම්, න්‍යෂ්ටික අනතුරු, වනසතුන් පහරදීම්, රථවාහන අනතුරු, දියේ ගිලීම් හාවැව් බැම් බිඳීයාම ආදියයි.

මූලාශ්‍රය: 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත

සුළිකුනාටු, භූමිකම්පා යනාදිය ප්‍රධාන වේ (ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, 2019). මෝසම්වල වෙනස්කම් හේතුවෙන් නියගය ද බහුලව දක්නට ලැබේ. ශ්‍රී ලංකාව දේශීයව හෝ ඍතුමය වශයෙන් මුහුණදෙන ගංවතුර, ප්‍රජාවට විශාලතම තර්ජනයක් වන අතර එය කාලගුණ විද්‍යාත්මක උපද්‍රවවල බලපෑම වැඩිවීම හේතුවෙන් අවදානම් තත්ත්වයන් ඉහළ යමින් පවතී (GFDRR, 2017).


ස්වභාවික ආපදා තත්ත්වයන් නිසා බහුතරයක් දිස්ත්‍රික්කයන්හි පාසල්හි අධ්‍යාපන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි වී තිබේ. විශේෂයෙන්ම ගංවතුර හා නායයාම් නිසා ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම, ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියට ඍණාත්මකව බලපානු ඇත. මෙහිදී,


- පාසල් පැවැත්වෙන දින ගණන සීමා වීම.
- පාසල් ශිෂ්‍යයන් මානසික වශයෙන් හා භෞතික වශයෙන් පීඩාවට පත්වීම.
- පාසල් උපකරණ හා පොත්පත් විනාශ වීම.
- පාසල් ගොඩනැගිලිවලට හානි ඇතිවීම.
- පාසල් ළමයින්ගේ ජීවිත තර්ජනයට ලක් වීම.

යනාදී තත්ත්වයන් අවම කරගැනීමේ අරමුණින් අප සියලු දෙනා කඩිනමින් කටයුතු කළ යුතුවේ. මේ පිළිබඳව රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලික ආයතන අධ්‍යාපන සුරක්ෂිතතාව වෙනුවෙන් මැදිහත්වෙමින් සිටී. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගකීම් දරන ආයතන වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යි. මෙහිදී ආපදාවක් ඇතිවීමට ප්‍රථම ගනු ලබන ක්‍රියාමාර්ග අතිශයින් වැදගත් වේ. එසේම මේ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන ආකාරය හා ගන්නා උපායමාර්ග වැදගත් වේ.

හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර කෙරෙහි අවධානය යොමු කිරීමේදී, අධ්‍යාපන අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්ව School Disaster Risk Reduction Management (SDRRM) අධ්‍යාපන අංශයේ පාසල් අවධානම් අවම කිරීමේ ආපදා කළමනාකරණ සැලැස්ම මගින් ආපදා තත්ත්වයන්ගෙන් හුදකලා වූ ප්‍රදේශයන්හි ප්‍රජාව දිරිමත් කිරීම, UNICEF, Save the Children, Red Cross යන අන්තර්ජාතික ආයතන මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණය පැවැත්වීම හා National Education Response Frameworks ජාතික අධ්‍යාපන ප්‍රතිචාර රාමුව සකස් කිරීම යනාදිය වැදගත් වේ.

හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගෝලීය අවධානය යොමුව තිබේ. මෙහිදී විශේෂයෙන්ම **INEE ප්‍රමිතීන්** වැදගත් වේ. ඒවා මගින් මොනයම් හෝ හදිසි අවස්ථාවකදී හෝ ගුණාත්මක, ආරක්ෂිත හා සියලුදෙනා ඇතුළත් වූ අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා වූ ප්‍රමිතීන් හඳුන්වා දී ඇත. 2000 වසරේ ආරම්භ වූ මෙම INEE ප්‍රමිතීන් මගින් හදිසි අවස්ථා තුළ අඛණ්ඩ අධ්‍යාපනය පවත්වා ගැනීම සඳහා සිදු කරනුයේ තීරණාත්මක කාර්යය භාරයකි. INEE ප්‍රමිතින්හි මූලික අරමුණ වන්නේ, හදිසි අවස්ථාවලදී සම්බන්ධීකරණය, හදිසි අවස්ථාවලදී අධ්‍යාපනය සැලසුම් කිරීම



හා ස්වාභාවික විපත් හෝ අවතැන්වීම්වලදී අධ්‍යාපන ප්‍රතිචාරවලට සහාය වීම යනාදිය යි. අධ්‍යාපනය තුළ දේශීය අවශ්‍යතා හා ගෝලීය සම්බන්ධීකරණය පවත්වාගෙන යාමේදී සෑම ළමයෙක්ම හදිසි අවස්ථාවකදී ආරක්ෂා කර ගැනීම, වඩාත් අභියෝගාත්මක තත්ත්වයකදී අඛණ්ඩව අධ්‍යාපනය පවත්වා ගෙන යාම හා ක්‍රියාකිරීම සඳහා මෙම ෂහැ ප්‍රමිතීන් ඉතා වැදගත් වේ. එම INEE ප්‍රමිතීන් පහත දක්වා ඇත. ඒවා නම්,

Domain 1: Foundational Standards for a Quality Response|ගුණාත්මක ප්‍රතිචාර සඳහා පදනම් වූ ප්‍රමිතීන්

Domain 2: Access and Learning Environment|ප්‍රවේශය හා ඉගෙනුම් පරිසරය

Domain 3: Teaching and Learning|ඉගැන්වීම හා ඉගෙනුම

Domain 4: Teachers and Other Education Personnel|ගුරුවරුන් හා අනෙකුත් අධ්‍යාපන පිරිස්

Domain 5: Education Policy|අධ්‍යාපන ප්‍රතිපත්ති

මීට අමතරව මේ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන හා වැඩ සැලසුම් පහත පරිදි පෙන්වාදිය හැකිය.

- **Inter-Agency Network for Education in Emergencies (INEE)** – provides standards and guidance.
- **Education Cannot Wait (ECW)** – global fund for crisis-affected education.
- **Sendai Framework for Disaster Risk Reduction (2015–2030)**
- **Sustainable Development Goal 4 (SDG 4)** – includes targets for inclusive, quality education in all contexts, including emergencies.

**Education Cannot Wait** යනු, අර්බුද සහ දිගුකාලීන විපත් නිසා පීඩාවට පත් වූ ළමුන්ට සහ තරුණයින්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පිහිට වූ පළමු ගෝලීය අරමුදලයි. 2016 සමුළුවේදී එය ආරම්භ කරන ලදී. ECW හි අරමුණ වන්නේ ගැටුම්, ස්වභාවික විපත්, සහ බලහත්කාරයෙන් සිදුකෙරෙන නැවත පදිංචිකිරීම් යනාදී අර්බුදවලින් බලපෑමට ලක්වූ ළමුන් මුණදෙන අභියෝගවලට කඩිනමින් සහය ලබාදෙමින් දිගුකාලීන අධ්‍යාපන සහාය ලබාදීමයි. මෙම අරමුදල මඟින් විශේෂයෙන්ම වඩාත් අවදානමට ලක්වූ සහ අධ්‍යාපන ප්‍රවේශය අසීරු ළමුන් (දියණියන්, විශේෂ අවශ්‍යතා ඇති ළමුන්, ග්‍රාමීය ප්‍රජාව හා රැකවරණය අහිමිවූ ළමුන්) ඉලක්ක කර ගනු ලැබේ. ECW ක්‍රියාත්මක වන්නේ රජයන්, ජාත්‍යන්තර ආයතන, සහ මානුෂීය සංවිධාන, සහ පරිත්‍යාගකරුවන් සමඟ ඍජු සහයෝගීතාවය මතය.

ECW අරමුදලින් අරමුණු 3ක් සඳහා අරමුදල් ප්‍රදානය කරන අතර ඒවානම්,

1. ඉක්මන් හදිසි අවස්ථා ප්‍රතිචාර (First Emergency Response)
2. වසරකට වැඩි කාලයක් ක්‍රියාත්මක වන ආරක්ෂක වැඩසටහන් (Multi-Year Resilience Programs)
3. පර්යේෂණ සහ ප්‍රතිඵල මූලික වැඩසටහන්

ECW ආයතනය විවිධ වැඩසටහන් මඟින් ලාංකීය අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ගෝලීය තිරසාර අධ්‍යාපන අරමුණු (SDG 4) හා සම්බන්ධ වෙයි. මෙය "INEE","UN",UNICEF","UNESCO" වැනි ආයතන සමඟ එකට කටයුතු කරමින් අර්බුද සමයේ අධ්‍යාපනයේ අරමුණ සාර්ථක කරයි.




**සෙන්ඩායි වැඩසැලැස්මෙහි (Sendai Framework)** 2015-2030 ආපදා අවදානම් අඩුකිරීම සඳහා වූ ගෝලීය ක්‍රියාමාර්ග ඇතුළත් වේ. සෙන්ඩායි (Sendai Framework for Disaster Risk Reduction 2015-2030) 2015 මාර්තු මාසයේ ජපානයේ සෙන්ඩායි නගරයේදී පැවති ජාත්‍යන්තර සමුළුවකදී ආරම්භ කරන ලදී. මෙහි අරමුණ වන්නේ ජීවිත, ආදායම්, සම්පත්, හා පරිසරය ආරක්ෂා කිරීම, ආපදා වලට මුහුණ දීම සඳහා කාර්යක්ෂම හා තිරසාර උපායමාර්ගයන් සකස් කිරීම, සහ රටවල්වල හා සමාජවල ආපදා කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම යි.

සෙන්ඩායි මූලික අරමුණු කීපයකි. ඒවානම්,

- ආපදා හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම
- ආපදා වලින් බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව අඩු කිරීම
- ආපදා හේතුවෙන් සිදුවන ආර්ථික හානිය අඩු කිරීම
- ප්‍රධාන යටිතල පහසුකම් සහ මූලික සේවාවලට සිදුවන හානිය අවම කිරීමට කටයුතු කිරීම
- ආපදා අවදානම් අඩුකිරීමේ උපායමාර්ග භාවිතා කරන රටවල් ගණන ඉහළ නැංවීම හා ඒ සඳහා මඟ පෙන්වීම
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කිරීම
- පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති සහ ආපදා අවධානම් තොරතුරු වෙත ප්‍රවේශය වැඩි කිරීම

මේ ආකාරයට සමස්තයක් ලෙස සලකා බලන විට, හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය වර්තමානයේ ගෝලීය අවධානය යොමු වූ මාතෘකාවක් වී ඇති බව නිගමනය කළ හැකිය. හදිසි අවස්ථාවන් තුළදී අඛණ්ඩව අධ්‍යාපනය පවත්වා ගෙන යාම වෙනුවෙන් විවිධ උපායමාර්ග යොදා ගැනීම වැදගත් පියවරක් බව අවධාරණය කළ යුතු අතර එය අනාගත අභිවෘද්ධිය සඳහා හේතු වේ. හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සම්බන්ධයෙන් උපායමාර්ග ගැනීමේදී ක්ෂණික විසඳුම් වෙනුවට දිගුකාලින තිරසාර උපායමාර්ග භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමුවිය යුතුවේ. මේ සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීමේදී රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන හා සිවිල් ප්‍රජාව ද සහභාගී කර ගැනීම වඩාත් ඵලදායි වනු ඇත. ඒ අනුව හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සම්බන්ධයෙන් ජාතික, ජාත්‍යන්තර යන සෑම අංශයකම අවධානය යොමු වී ඇති බවත් 2015-2030 තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වීමත් ධනාත්මක පැතිකඩක් ලෙස හඳුනාගත හැකිය.

කේ.ඒ. ආර්. ලක්මාලි
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

# කාන්තා ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම්




1995 වසරේ මැනිලා නුවරදී ජාත්‍යන්තරව සැලසුම් කල මාපිය සංවිධාන එකතුව පැවැත්වූ ජාත්‍යන්තර සම්මේලනයේ දී සම්මත වී ඇති කාන්තා ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් පිළිබඳ අප දැනුවත් විය යුතුව ඇත. මෙලෙස මෙම අයිතිවාසිකම් පිළිබඳ අප දැනුම්වත් විය යුත්තේ ඒවා ශ්‍රී ලංකාවටද එක සේ වලංගු වන බැවිනි.

කාන්තා ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් යනු මොනවාද?

1. ජීවත්වීමට ඇති අයිතිය (අනාරක්ෂිත හෝ අවදානම් වූ ගැබ් ගැනීමට ලක් නොවීම)
2. බලහත්කාර ගැබ් ගැන්වීම, වන්ධ්‍යාකරණය, ගබ්සාවකට ලක් නොවීමේ ස්වාධීනත්වය හා ආරක්ෂාව භුක්තිවිඳීමේ අයිතිය
3. ප්‍රජනන සෞඛ්‍ය තත්ත්වය හෝ ලිංගික ජීවිතය නිසා වෙනස් කොට සලකුම්වලට භාජනය නොවීමේ අයිතිය
4. ප්‍රජනන සෞඛ්‍ය සේවා ලබා ගැනීමේදී පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය සුරැකීමේ අයිතිය
5. විවිධ මත විශ්වාස, දර්ශන හා චාරිත්‍ර අනුව කෙරෙන පටු විග්‍රහයන් මත පදනම්වන තහනම්වලින් නිදහස්ව සිතීමට හා ක්‍රියා කිරීමට ඇති අයිතිය
6. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සඳහා තොරතුරු, අධ්‍යාපනය හා සේවා ලබා ගැනීමට ඇති අයිතිය
7. විවාහ වීමට හෝ නොවීමට හා විවාහ වී සැලසුම් සහගතව පවුල සකස් කර ගැනීමට ඇති අයිතිය
8. දරුවන් ලබා ගැනීමට හෝ ලබා නොගැනීමට හෝ කවදා ලබා ගත යුතුදැයි තීරණය කිරීමේ අයිතිය
9. තම සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අවශ්‍ය තොරතුරු හා සේවා සම්බන්ධයෙන් තම පෞද්ගලිකත්වය, ආත්ම ගරුත්වය හා රහස්‍ය භාවය රැක ගනිමින් අඛණ්ඩ සේවා සඳහා ද තම අදහස් ඒ පිලිබඳව ප්‍රකාශ කිරීමටද ඇති අයිතිය
10. සියලුම සේවාලාභීන්ට පිළිගත් නව ප්‍රජනන විද්‍යා තාක්ෂණයේ ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය
11. රැස්වීමට, දේශපාලන කටයුතුවලට සහභාගිවීමට හා ප්‍රජනන සෞඛ්‍ය හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් රජයට බලපෑම් කිරීමට ඇති අයිතිය
12. ලිංගික හිංසා, දූෂණ, අපචාර, අපයෝජන හා සුරාකෑම් වලින්ද කෲරතර සැලකුම්වලින්ද මිදී සිටීමට ඇති අයිතිය


එසේම, 1995 බීජිංහිදි පැවැත්වූ IV වැනි ජගත් කාන්තා සමුළුව අවසානයේදී සම්මත වූ ක්‍රියාකාරී සැලැස්ම (Platform for Action) නම් ප්‍රකාශනයෙහි සඳහන් වන පරිදි 'තම ලිංගිකත්වය පිළිබඳ කරුණු ස්වකීය පාලනය යටතේ සිදු කිරීම හා ඒ සම්බන්ධව වගකීමකින් යුතුව නිදහසේ තීරණ ගැනීමට අමතරව අන්‍යෝන්‍ය ගරුත්වය හා කැමැත්ත මත ඇතිවන ලිංගික චර්යාවේදීත්, එමගින් මතුවන තත්ත්වයන්හිදීත් දෙපාර්ශවයම වගකීමෙන් බැඳී සිටීමෙන් කාන්තාවන් හා පුරුෂයන් අතර සමානාත්මතාවය පදනම් වූ සම්බන්ධතා ඇති කෙරේ.'

මේ අප අතර අපේක්ෂා කෙරෙන ඉතාම සාධනීය වූ තත්ත්වයන් වන අතර එමඟින් කාන්තා මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම, වෙනස් කොට සැලකීම, ප්‍රචණ්ඩත්වයට ලක් කිරීම වැනි අගතිගාමී බලපෑම්වලින් තොරව සමානාත්මතාවය හා ගරුත්වය සුරැකෙන මනා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය තත්ත්වයක් පවත්වා ගෙන යාමට අවකාශ ලැබේ.

1993 මාර්තු මස ප්‍රකාශයට පත් ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තියෙහි අංක 13 කොටසේද මෙකී හිමිකම් සංක්ෂිප්තව ගැබ්ව තිබේ.

**කලාභූෂණ කේ. ඩී. පීරිස් මහතා**

# සබරගමු පළාතේ පාසල් අධ්‍යාපනයේ අඛණ්ඩබාවයට, ස්වභාවික ආපදා තත්ත්වයන්හි බලපෑම




Complied by Lakmali K.A.R

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සබරගමුව පළාත රටේ වඩාත්ම ආපදාවන්ට ලක්විය හැකි ප්‍රදේශවලින් එකක් වන අතර එය ගංවතුර, නායයෑම් සහ අධික මෝසම් වැසි වලින් නිතර පීඩාවට පත්වේ. පළාතේ අධ්‍යාපන පද්ධතිය එහි දේශීය ආර්ථිකයට සහ සංවර්ධනයට ධනාත්මක බලපෑමක් සිදුකරයි. කෙසේ වෙතත් ස්වාභාවික විපත් අධ්‍යාපනයට සැලකිය යුතු බාධා ඇති කරයි. එවැනි සිදුවීම් අධ්‍යාපනයේ අඛණ්ඩතාවයට දැඩි ලෙස බලපාන අතර එය පාසල් වසා දැමීම, ඉගැන්වීමේ කාලය අහිමි වීම, සිසුන්ට සහ ගුරුවරුන්ට මානසික සෞඛ්‍ය ගැටළු ඇති කිරීමට හේතු වේ. මෙම ලිපියේ අරමුණ වන්නේ අධ්‍යාපනයේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගැනීමේදී පාසල් මුහුණ දෙන අභියෝග, ආපදා අවස්ථාවන්හිදී අධ්‍යාපනය කළමනාකරණය කිරීමේදී රජයේ සහ ප්‍රජාවේ කාර්යභාරය සහ ස්වාභාවික විපත් හමුවේ ක්‍රියාකාරීව සිටීමට පාසල්වලට උපාය මාර්ග අනුගමනය කළ හැකි ආකාරය පරීක්ෂා කර බැලීමයි.


2. සාහිත්‍ය සමාලෝචනය

ස්වාභාවික විපත් ලොව පුරා අධ්‍යාපන පද්ධති කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑම් ඇති කරන බව පර්යේෂණ ගණනාවකින් තහවුරු වී තිබේ. අධ්‍යයනවලින් පෙනී යන්නේ ගංවතුර හා නායයෑම් වලට ගොදුරු විය හැකි ප්‍රදේශවල පාසල් වැසීම නිතර සිදුවන බවත්, යථා තත්ත්වයට පත්වීමට මාස හෝ වසර ගණනාවක් ගත විය හැකි බවත්ය (UNICEF, 2020). උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ, 2017 ගංවතුර හේතුවෙන් 600,000 කට අධික ජන සංඛ්‍යාවක් ආපදා නිසා පීඩාවට ලක් වූ අතර එම පවුල්හි ළමුන්ගේ අධ්‍යාපනයට බලපෑම් එල්ල විය.

ස්වාභාවික විපත් බොහෝ විට භෞතික යටිතල පහසුකම් වලට හානි කරයි. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයට අනුව, සබරගමුවේ ගංවතුරට ගොදුරු වන සහ නායයෑම් ඇති ප්‍රදේශවල බොහෝ පාසල් මෝසම් කාලවලදී සැලකිය යුතු හානියක් සිදුවන අතර එමඟින් නැවත පාසල් ආරම්භ කිරීම ප්‍රමාද වේ. පන්ති කාමර, පුස්තකාල සහ සනීපාරක්ෂක පහසුකම් ගුණාත්මක අධ්‍යාපනයක් ඇති කිරීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. නිත්‍ය පහසුකම් නොමැති විට, පාසල් නැවත ගොඩනැගීමට සහ තාවකාලික පන්ති කාමර සංවිධානය කිරීමට ප්‍රාදේශීය ප්‍රජාවන් බොහෝ විට එක්වෙති. රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් මානුෂීය සංවිධාන සිසුන්ට සහ ගුරුවරුන්ට අධ්‍යාපනික ද්‍රව්‍ය සහ චිත්තවේගීය සහයෝගය ලබා දීමෙන් ද සහාය ලබා දේ.

ක්‍රමවේදය

ස්වභාවික විපත් වලදී සබරගමුව පළාතේ පාසල් අධ්‍යාපනයේ




අඛණ්ඩතාවයට බලපාන සාධක ගවේෂණය කිරීම සඳහා මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් භාවිතා කර ඇත. පළාතේ ගංවතුර සහ නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල පාසල් කිහිපයක් තෝරා ගනිමින් පර්යේෂණය සිද්ධි අධ්‍යයන ප්‍රවේශයක් මෙහිදී උපයෝගී කරගෙන ඇත. පාසල් පරිපාලකයින්, ගුරුවරුන්, සිසුන් සහ රජයේ නිලධාරීන් වැනි ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වනු ලදී. පාසල් විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ ප්‍රාදේශීය අධ්‍යාපන බලධාරීන් ඇතුළු සහභාගිවන්නන් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා මඟින් ඔවුන් මුහුණ දුන් අභියෝග සහ භාවිතා කරන උපාය මාර්ග පිළිබඳ අවබෝධයක් රැස් කිරීම සිදු කරන ලදී. ලේඛන විශ්ලේෂණය මඟින් අධ්‍යයනයට පුළුල් සන්දර්භයක් සැපයීම සඳහා ආපදා සූදානම් වීමේ සැලසුම්, රජයේ වාර්තා සහ පෙර සිද්ධි අධ්‍යයන වැනි නිල වාර්තා සමාලෝචනය කරන ලදී. සබරගමුව පළාතේ අධ්‍යාපනයට ස්වභාවික විපත්වල බලපෑම අත්විඳ ඇති සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා අරමුණු සහිත නියැදීම භාවිතා කරනු ලැබේ. යටිතල පහසුකම් හානි, මනෝ සමාජීය බලපෑම් සහ අධ්‍යාපනය පවත්වාගෙන යාමේදී තාක්ෂණයේ කාර්යභාරය වැනි ප්‍රධාන ගැටළු උපුටා ගැනීම සඳහා දත්ත කේතනය කරනු ලැබේ.

**දත්ත විශ්ලේෂණය සහ සොයාගැනීම්**

- සබරගමුව පළාතේ ගංවතුර සහ නායයෑම් හේතුවෙන් දීර්ඝ කාලයක් පාසල් වසා දැමීමට සිදුවන බව පාසල් පරිපාලකයින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් හෙළි විය. උදාහරණයක් ලෙස, 2017 දී පළාතේ ගංවතුර හේතුවෙන් පාසල්වලින් 50% ක් සති දෙකකට වැඩි කාලයක් වසා දැමීමට සිදුවිය. මේ තත්ත්වයන් අඛණ්ඩව යම් නිශ්චිත ස්ථානවලින් වාර්තා වී ඇත. මෙහි බලපෑම් විවිධ වර්ෂවල, විවිධ මට්ටමින් සිදු ව ඇති බව අනාවරණය විය.
- මෙවැනි අභියෝගකර තත්ත්වයන්ට මුණ දීම නිසා ශිෂ්‍යයන්ට ඇතිවන කම්පනයන්, ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වයන්හි ගුණාත්මක අධ්‍යාපනයට බලපෑම් ඇති කරනු ලබයි. එය අධ්‍යාපනයට සිදු වන බලපෑම් කර තත්ත්වයක් බවත් ඒ හේතුවෙන් පාඩම් නැවත ආරම්භ කිරීමේදී ගුරුවරුන් අභියෝගයට ලක්වන බවත් හෙළිවිය.
- තාවකාලික නවාතැන් සහ ආපදාවන්ට ඔරොත්තු දියහැකි යටිතල පහසුකම් ගොඩනැගීම වැනි රජයේ පියවර සමහර සහභාගිවන්නන් විසින් ඇගයීමට ලක්කළහ. එසේ නමුත් මෙම ක්‍රියාමාර්ග සියලුම පාසල්වල අවශ්‍යතා සපුරාලීමේ දී ප්‍රමාණවත් නොවන බව සොයා ගන්නා ලදී. අඛණ්ඩ තිරසාර අධ්‍යාපන ක්‍රියාමාර්ගවලට වඩා ක්ෂණික සහන කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇත.
- ස්වේච්ඡා කණ්ඩායම් මනාව සංවිධානය කිරීමෙන්, හානියට පත් පාසල් නැවත ගොඩනැගීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ පවතින ඔරොත්තු දීමේ හැකියාව හෙළිවිය. Save the children වැනි රාජ්‍ය නොවන සංවිධාන පාසල් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික ද්‍රව්‍ය සැපයීමේදී වැදගත් කාර්යයභාරයක් ඉටු කර ඇත.

සබරගමුව පළාතේ අන්තර්ජාල සේවා සීමිත බැවින් මාර්ගගත (Online) ඉගෙනීම දුෂ්කර වේ. කෙසේ වෙතත්, සමහර පාසල් සිසුන් ඉගෙනීම දිගටම කරගෙන යාම සහතික කිරීම සඳහා දේශීය ගුවන් විදුලි විකාශන සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන අධ්‍යාපනික මුලපිරීම් භාවිතා කර ඇත.

**නිගමන සහ නිර්දේශ**

ස්වභාවික විපත් සබරගමුව පළාතේ පාසල් අධ්‍යාපනයේ අඛණ්ඩතාවයට දැඩි බලපෑමක් ඇති කරන බව අධ්‍යයනයෙන් නිගමනය වේ. රජයේ මුලපිරීම් සහ ප්‍රජා ඔරොත්තු දීමේ උත්සාහයන් මෙම බලපෑම් සමහරක් අවම කිරීමට උපකාරී වී ඇතත් ප්‍රතිචාර යාන්ත්‍රණයන්හි සැලකිය යුතු දුර්වලතා පවතී.

**නිර්දේශ**

ස්වභාවික ආපදා තත්ත්වයකදී ඔරොත්තු දිය හැකි ආකාරයේ ශක්තිමත්ව ගොඩනැගිලි ඉදිකල යුතු වේ. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වසා දැමීම් වලදී වඩාත් ශක්තිමත් ආපදා-ප්‍රතිරෝධී පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සහ පාසල් විකල්ප ඉගෙනුම් අවකාශයන්ගෙන් සමන්විත කිරීම නිර්දේශ කෙරේ.

ස්වභාවික විපත් නිසා ඇතිවන මානසික සෞඛ්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහා පාසල් සිසුන්ට සහ ගුරුවරුන්ට මනෝ සමාජීය සහාය ලබා දිය යුතුය.

තාක්ෂණයේ වැඩිදියුණු කළ භාවිතය ග්‍රාමීය ප්‍රදේශවල අන්තර්ජාල ප්‍රවේශය පුළුල් කිරීම සහ ඩිජිටල් සාක්ෂරතාවයට සහාය දැක්වීම, පාසල් වසා දැමීමේදී මාර්ගගතව ඉගෙනීමට පහසුකම් සැලසීම යනාදී ක්‍රියාමාර්ග නංවාලීමට කටයුතු කළ යුතුවේ.

රජය සහ ප්‍රජා සහයෝගීතාවය රජය සහ ප්‍රාදේශීය ප්‍රජාවන් අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීම අධ්‍යාපනික බාධාවන් අතරතුර වේගවත් සුවය සහ වඩාත් සම්බන්ධීකරණ ප්‍රතිචාරයක් සහතික කරනු ඇත.

**සීමාවන්**

දත්ත වෙත ප්‍රවේශය - සබරගමුවෙහි ග්‍රාමීය ස්වභාවය නිසා දුරස්ථ පාසල් වෙත ප්‍රවේශ වීම දුෂ්කර වූ අතර සහභාගිවන්නන් සංඛ්‍යාව සීමා කළේය. යාවත්කාලීන දත්ත නොමැතිවීම.


කාල සීමාවන් - අධ්‍යයනය සීමිත කාල රාමුවක් තුළ සිදු කරන ලදී. එනම් කලාපයේ සියලුම පාසල් පර්යේෂණයට ඇතුළත් කළ නොහැකි බවයි.

**නිගමනය**

සබරගමුව පළාතේ ස්වාභාවික විපත් වලදී අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාමේදී පාසල් ශිෂ්‍යයන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග මෙම ලිපියෙන් ඉස්මතු කරයි. අනාගත ව්‍යසනයන්හිදී අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බව සහතික කිරීම සඳහා රජය, සිවිල් ප්‍රජාවන් එක්ව තාක්ෂණික විසඳුම් ඇතුළත් වඩාත් ඒකාබද්ධ ප්‍රවේශයක් සකස් කිරීමේ වැදගත්කම මනාව පිළිබිඹු වේ.

**හසිනි සිතාරා, අහිංසා සහ නිපුන් දිල්ශාන්**
EIE තරුණ කණ්ඩායම, රත්නපුර

# Eco - School




*Eco Schools Themes*

In today's world, where environmental issues like climate change, pollution, and resource depletion are becoming increasingly urgent, education plays a vital role in shaping responsible and environmentally conscious citizens. The Eco-Schools programme is a global initiative that encourages young people to engage with their environment by allowing them the opportunity to actively protect it. Launched by the Foundation for Environmental Education (FEE), Eco-Schools follows a unique seven-step framework that promotes environmental awareness through practical learning and student-led action. Central to the programme is the Eco Committee a group of students, teachers, and sometimes parents and community members who lead sustainability projects within their schools. These may include waste reduction, energy saving, water conservation, and biodiversity enhancement. The initiative not only improves the environmental performance of schools but also fosters leadership, responsibility, and teamwork among students. In countries like Sri Lanka, where environmental challenges and natural beauty coexist, the Eco-Schools programme offers a powerful platform for schools to engage with sustainability at a grassroots level. By integrating eco-friendly practices into daily school life, students gain real-life experiences that help them grow into informed and active citizens. Despite challenges such as limited resources or awareness in some areas, the impact of Eco-Schools continues to grow, proving that when students are empowered, real change is possible. Through this programme, education becomes a tool not just for academic success, but for building a sustainable future for all.

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය, 2025 වසරේ අධ්‍යාපනයේ උන්නතිය උදෙසා ගනුලැබූ නව ප්‍රයත්නයන්

2025 වසරේ කාර්තු දෙකක් අවසන් වන මෙම මොහොතේ අධ්‍යාපන සංවර්ධන සන්ධානය, සැමට ගුණාත්මක අධ්‍යාපනයක් නඟා සිටුවීමේ අරමුණින් සිදු කල වැඩසටහන් සම්බන්ධයෙන් විවරණයක් මෙන්ම සමාජමය කතිකාවතක් ඇති කිරීම මෙම ලිපියෙහි අරමුණයි.

**2025 පෙබරවාරි මාසය**

මෙම මාසයේදී ගෝලීය අවධානය යොමු වූ අධ්‍යාපනයට වැඩි වශයෙන් බලපෑම් කරන "**හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය (Education in Emergency)**" පිලිබඳව අපගේ අවධානය යොමු විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ස්වභාවික පිහිටීම අනුව ගංවතුර හා නායයාම්වලින් වැඩි වශයෙන් පිඩාවට පත්වන හෝ පත් වූ තරුණයන්/ශිෂ්‍යයන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ අනුව අප සාමාජික සංවිධානයන්ගේ සහයෝග යෙන් තෝරාගන්නා ලද තරුණ/ශිෂ්‍ය කණ්ඩායම වෙනුවෙන් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි අරමුණ වුයේ හදිසි අවස්ථාවකදී පවා, අඛණ්ඩව අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා තරුණ ශිෂ්‍ය/ප්‍රජාව ප්‍රතිපත්තිමය වශයෙන් බලපෑම් කිරීමට ක්‍රියාමාර්ග සකස් කිරීමට සවිබල ගැන්වීම යි. මේ අනුව,

1 හදිසි අවස්ථා තුල අධ්‍යාපනය සම්බන්ධයෙන් තරුණ/ශිෂ්‍යයන් සඳහා INEE ප්‍රමිතීන් හා ආපදා කළමණාකරණය සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධන ව ැඩසටහනක් පැවැත්වීම.

2 හදිසි අවස්ථා තුල අධ්‍යාපනය සම්බන්ධයෙන් තරුණ/ශිෂ්‍යයන් සඳහා උද්දේශනය සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්වීම.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වැඩසටහන්වලින් අනතුරුව තරුණ/ශිෂ්‍ය කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම, ෆේස්බුක් පිටුවක් ආරම්භ කිරීම යනාදිය සිදු කරන ලදී. ඔවුන් මෙම ප්‍රතිපත්ති මාලාව සබරගමු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියට හා අතිරේක අධ්‍යක්ෂකතුමාට පිළිගන්වන ලදී. ඔවුන් විසින් ඉදිරිපත් කල ප්‍රතිපත්ති මාලාව පහත දක්වා ඇත.

**ආපදා තත්ත්වයකදී වුවත් අඛණ්ඩව අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා සබරගමු පළාත් තරුණ කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවලිය**


- *ගංවතුරින් ආපදාවට ලක්වන පාසල් සදහා ආපදාවලට ඔරොත්තු දියහැකි දෙමහල් හෝ සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කිරීම.*
- *ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපනය සදහා ක්‍රමවත්ව ආපදා කළමනාකරණ විෂය සම්බන්ධ දැනුම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුලත් කිරීම.*
- *පාසල් ආපදා කළමනාකරණ කමිටු නිසි පරිදි සකස් කර අදාළ කාර්යයන් විමධ්‍යගත කිරීම හා අධීක්ෂණ ක්‍රමවේදයක් ඇති කිරීම.*
- *ආපදා තත්ත්වයන්වලදී මුහුණදීමට හැකි වන පරිදි ප්‍රයෝගික පුහුණු (පිහිනීමට/ ඔරු පැදීමට / ගස් නැගීමට) පාසල් මට්ටමින් හා ගම මට්ටමින් ක්‍රියාත්මක කිරීම.*
- *ජාත්‍යන්තර ආයතන හා සම්බන්ධ වී ආපදාවලදී ඇතිවන දේපල හානි සදහා හානිපුර්ණ ලබා ගැනීමට අවස්ථා උදාකර ගැනීම පිළිබද තරුණ ප්‍රජාවට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම*
- *අණපනත් සකසන ආයතන හා රාජ්‍ය සංවිධානවලට ඉල්ලීම් කිරීමට හැකි සුදුසු පරිසරයක් තරුණ ප්‍රජාවට නිර්මාණය කිරීම.*
- *ආපදා කාලසිමාව තුලදී ඇතිවන වසංගත රෝග සදහා නිසි ප්‍රතිකාර ලබාදීම හා සෞඛ්‍ය කදවුරු පැවැත්වීම.*
- *ආපදා කළමනාකරණය සම්බන්ධ ආයතන, අදාළ පාර්ශව හා සිවිල් සංවිධාන අතර ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.*
- *ආපදා අවස්ථාවලදී අඛණ්ඩව අධ්‍යාපනය පවත්වා ගෙනයාම සදහා තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීම (Zoom, Team ආදිය) හා ඒ සදහා අවශ්‍ය අන්තර්ජාල පහසුකම් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙයි.*



අධ්‍යාපන සංවර්ධන සන්ධානය "අධ්‍යාපන ප්‍රතිපත්ති **සම්පාදනය සඳහා සිවිල් සංවිධාන දායකත්වය හා ප්‍රතිඵල මූලික කළමනාකරණය (Results Based Managament)"** සම්බන්ධ වැඩමුළුවක් බස්නාහිර පළාත් අධ්‍යාපන සැලසුම් නිලධාරීන් සඳහා පෙබරවාරි මාසයේදී සංවිධානය කරන ලදී. ඒ සඳහා කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්කයන්හි කලාප අධ්‍යක්ෂකවරුන් ඇතුළු අධ්‍යාපන සැලසුම් නිලධාරීන් 40 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වූ අතර ප්‍රධාන සම්පත් දායකත්වය සපයන ලද්දේ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු සැලසුම් අධ්‍යක්ෂක ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා හා වත්මන් සැලසුම් අධ්‍යක්ෂිකා ජයනි ප්‍රිශංගිකා මහත්මිය විසිනි සිදු කරන ලදී. මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් උදාරා ටී. දික්කුඹුර මහත්මිය ද, බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක පී.ආර්. පී.ආර්. දේවබන්දු මහතා ද, බස්නාහිර පළාත් අධ්‍යාපන සැලසුම් අධ්‍යක්ෂිකා අනෝමා බස්නායක මහත්මිය ද මෙම වැඩසටහන සඳහා සහභාගී විය. ඊට අමතරව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය නියෝජනය කරමින් භාණ්ඩාගාරික චමින්ද පියසේකර මහතාත්, බස්නාහිර පළාත් අධ්‍යක්ෂක සචිත හේවගේ මහතාත්, **CED** කාර්යය මණ්ඩලයත් සහභාගී විය.

**2025 මාර්තු මාසය**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක වාර්තාවක් අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් 2025 මාර්තු මස 11 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී එළිදක්වන ලදී. **"Analysis of Education Policies, Policy Frameworks and Reform Initiatives in Sri Lanka: Strength, Relevance and Gaps in Education Policies and Policy making"** මෙම වාර්තාවෙහි දැක්වෙන ආකාරයට 1945-2023 කාලය තුල වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, අණ පනත් ආදිය මෙහිදී ගැඹුරින් විශ්ලේෂණය කර ඇති අතර අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ද මෙහි විශ්ලේෂනාත්මකව සඳහන් වේ. එහි කර්තෘ වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දීර්ඝ කාලයක් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කටයුතු කල අධ්‍යාපන සැලසුම් අධ්‍යක්ෂක ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා යි. මෙම විශ්ලේෂණ වාර්තාවේ සමාලෝචනය සිදු කරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය ආචාර්ය ප්‍රභා මනුරත්න මහත්මිය විසිනි. මෙම අවස්ථාවට අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩකටයුතු කරන කරන රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතනයන්හි නිලධාරීන් හා මාධ්‍යවේදීන් රැසක් සම්බන්ධ වී සිටියහ.




ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ගුණාත්මකබාවය ඉහළ නැංවීමටත්, එම ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු කරවා ගැනීම සඳහාත්, **ප්‍රශස්ත අන්දමින් සමාජ මාධ්‍ය භාවිතා කල හැකි ආකාරය පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහනක්** අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් 2025 මාර්තු 14 වන දින කොළඹ දී පවත්වන ලදී. මේ සඳහා සාමාජික සංවිධාන නියෝජනය කරමින් තරුණ තරුණියන් 35 කට අසන්න ප්‍රමාණයක් සහභාගී වූ අතර මේ සඳහා සම්පත් දායකත්වය සපයන ලද්දේ Transparency International ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයේ කළමනාකරු හරිත දහනායක මහතා විසිනි.




**2025 අප්‍රේල් මාසය**

අධ්‍යාපන සංවර්ධන සන්ධානය "අධ්‍යාපන ප්‍රතිපත්ති **සම්පාදනය සඳහා සිවිල් සංවිධාන දායකත්වය හා ප්‍රතිඵල මූලික කළමනාකරණය (Results Based Managament)"** සම්බන්ධ වැඩමුළුවක් උතුරුමැද පළාත් අධ්‍යාපන සැලසුම් නිලධාරීන් සඳහා අප්‍රේල් මාසයේදී සංවිධානය කරන ලදී. ඒ සඳහා අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි කලාප අධ්‍යක්ෂකවරුන් 38 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වූ අතර ප්‍රධාන සම්පත් දායකත්වය සපයන ලද්දේ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු සැලසුම් අධ්‍යක්ෂක ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා හා වත්මන් සැලසුම් අධ්‍යක්ෂිකා ජයනි ප්‍රිශංගිකා මහත්මිය විසිනි. ඊට අමතරව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය නියෝජනය කරමින් සභාපති ආචාර්ය චන්දන බණ්ඩාර මහතාත්, උතුරුමැද පළාත් අධ්‍යක්ෂිකා යසවතී වාසල මහත්මියත්, **CED** කාර්යය මණ්ඩලයත් සහභාගී විය.



**2025 මැයි මාසය**

ගෝලීය අධ්‍යාපන සතිය සැමරීම, සෑම වසරකම අප්‍රේල් මස 28 වන දින සිට මැයි මස 05 වන දින දක්වා පැවැත්වේ. මෙවර ගෝලීය අධ්‍යාපන සතියේ තේමාව වන්නේ, Education saves lives, Protect Eduation in Emergency (EIE) "අධ්‍යාපනය ජීවිතය සුරකියි, හදිසි අවස්ථාවන්වලදී අඛණ්ඩව අධ්‍යාපනය තහවුරු කරමු" යන්නය. ඒ අනුව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් ගෝලීය අධ්‍යාපන සතිය නිමිත්තෙන් හදිසි අවස්ථාවල අධ්‍යාපනය තහවුරු කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් Zoom තාක්ෂණය ඔස්සේ 2025 මැයි 24 වන දින පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය සපයන ලද්දේ හදිසි අවස්ථාවන්හි දී අධ්‍යාපනය සුරැකීම සම්බන්ධයෙන් උපදේශිකාවක් ලෙස කටයුතු කරන බියන්කා අබේගුණවර්ධන මහත්මිය විසිනි. මේ සඳහා සියලුම සාමාජික සංවිධානවලටත්, පාසල් අධ්‍යාපන කමිටු සාමාජිකයන්ටත්, තරුණ කණ්ඩායම්වලටත් ආරාධනා කර තිබිණි.




අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් සිදුකල "Analysis of Education Policies, Policy Frameworks and Reform Initiatives in Sri Lanka: Strength, Relevance and Gaps in Education Policies and Policy making" යන විශ්ලේෂණ වාර්තාව සම්බන්ධයෙන් සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2025 මැයි මස 22 දින කොළඹ දී පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය සපයන ලද්දේ ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා ය. මෙම අවස්ථාවට සාමාජික සංවිධාන නියෝජිතයන් රැසක් සහභාගී විය.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් සංවිධානය කරන ලද "අධ්‍යාපනයට මුදල් වෙන් කිරීම හා අයවැය ක්‍රියාවලිය" සම්බන්ධයෙන් වූ ධාරිතා සංවර්ධන වැඩසටහනක් කොළඹදී 2025 මැයි මස 31 වන දින පවත්වන ලදී. ඒ සඳහා සාමාජික සංවිධානයන්හි නියෝජිතයන් 45 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් සහභාගි වී සිටි අතර එ සඳහා සම්පත් දායකත්වය සපයන ලද්දේ මුදල් අමාත්‍යංශයේ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල් ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි මහතා විසිනි.



**2025 ජූනි මාසය**

අධ්‍යාපන සංවර්ධන සන්ධානය "**අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සිවිල් සංවිධාන දායකත්වය හා ප්‍රතිඵල මූලික කළමනාකරණය (Results Based Managament)**" සම්බන්ධ වැඩමුළුවක් ඌව පළාත් අධ්‍යාපන සැලසුම් නිලධාරීන් සඳහා 2025 ජූනි මාස 14 වන දින බදුල්ලේදී පවත්වන ලදී. ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් 39 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වූ අතර ප්‍රධාන සම්පත් දායකත්වය සපයන ලද්දේ අධ්‍යාපන අමාත්‍යංශයේ හිටපු සැලසුම් අධ්‍යක්ෂක ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා හා වත්මන් සැලසුම් අධ්‍යක්ෂිකා ජයනි ප්‍රියංගිකා මහත්මිය විසිනි. ඊට අමතරව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය නියෝජනය කරමින් අධ්‍යක්ෂක කමල් හේරත් මහතාත්, ඌව පළාත් සම්බන්ධීකාරක වජිර උමගිලිය මහතාත්, CED කාර්යය මණ්ඩලයත් මෙ සඳහා සහභාගී විය.





## මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන් පිටුවක්....

ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,
අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජිවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්තාවන් අපට කියන්න. මීලග හඬ සඟරාව සඳහා ඔබේ නිර්මාණ 2025 සැප්තැම්බර් 10 ට පෙර lakmalicedsrilanka@gmail.com මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12

ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12



**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය**
**web: cedsrilanka.org**
**දුරකතනය : 0112887642**